àø]×ù µû$÷ &{õæ ûõ (ã&& µû})

12 µÁ ó ×

# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

**(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි)**

**ආගම් දෙපාර්තමේන්තුව**
**භාෂා ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# හැඳින්වීම

වර්ෂ 2007 දී 6 සහ 10 යන ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එමනිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත්වනු ඇත.

අ.පො.ස (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10, 11 ශ්‍රේණි) විෂයමාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළයුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස (උ.පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා

අධ්‍යක්ෂ ජනරාල්

# සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්ට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තූතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙහි ඇතුලත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

## උපදේශක හා ලේඛක මණ්ඩලය

**මෙහෙයවීම** - මහාචාර්ය ලාල් පෙරේරා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශන හා**
**මඟ පෙන්වීම** - විමල් සියඹලාගොඩ මහතා
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** - ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
අධ්‍යක්ෂ (ආගම්)
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** - පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ. , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු කථිකාචාර්ය)
මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., කැලණිය විශ්ව විද්‍යාලය )
පූජ්‍ය ආචාර්ය තැරැලේ ධම්මරතන හිමි
(බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී, කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
පූජ්‍ය උඩුගම සුදස්සි හිමි (ව්‍යාපෘති නිලධාරි)
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,අධ්‍යාපනවේදී)
පූජ්‍ය තෙරපැහැ මේධංකර හිමි (සහකාර ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ. ගෞරව, එම්.ඒ., රාජකීය පණ්ඩිත, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)
ආචාර්ය උදිත ගරුසිංහ මහතා (බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය)
ගුණසේන මහතන්ත්‍රිගේ (බී.ඒ.ගෞරව, එම්.ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ)
එස්.පී. විතාන මයා (ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ., එම්. ඒ., පශ්. උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා )

**සංස්කරණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
(බී.ඒ.ගෞරව, පී.එච්.ඩී., අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යක්ෂ ආගම්, ජාතික අධ්‍යාපන ආයතනය)

**පරිගණක වදන් සැකසුම** : පී. නිල්මිණි ප්‍රනාන්දු මිය

**විවිධ සහාය** : එස්. සී. ප්‍රියදර්ශනී මිය
අයි. ජී. බෝජිත මයා

# පටුන


| | | |
|---|---|---|
| හැඳින්වීම | | iii |
| සංඥාපනය | | iv |
| අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන කොමසාරිස්තුමාගේ පණිවුඩය | | v |
| උපදේශක හා ලේඛක මණ්ඩලය | | vi |
| නිපුණතාව | 1.0 | 1 - 9 |
| නිපුණතාව | 2.0 | 10 - 13 |
| නිපුණතාව | 3.0 | 14 - 18 |
| නිපුණතාව | 4.0 | 19 - 22 |
| නිපුණතාව | 5.0 | 23 - 27 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම සහ ඉගෙනුම් උපකරණ | | 30 - 40 |

**නිපුණතාව 1.0** : ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන භාරතීය සාමාජ්‍ය, ආගමික, දේශපාලන හා ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම 1.1** : බුද්ධ කාලීන භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම හා ඒ පිළිබඳ බෞද්ධ විචාරය අධ්‍යනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 22

**ඉගෙනුම් ඵල** : සමානාත්මතාවයෙන් ක්‍රියා කරයි.
අයිතිවාසිකම් ආරක්ෂා කරයි.
වාද භේද බැහැරකොට කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

## 1.1.1 වර්ණ ධර්ම, ස්වධර්ම, ආපද්ධර්ම, ආශ්‍රම ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් සහ ඒවා පිළිබඳ බෞද්ධ විචාරය :

- බ්‍රාහ්මණයන් ඊශ්වර නිර්මාණවාදී පදනමක සිට සමාජ ප්‍රභවය ඉගැන්වූ බව.
- බුද්ධකාලීන සමාජයේ කුලක්‍රමයක් පැවති බව හා එය වර්ණ ධර්ම නමින් හැඳින්වුන බව
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනු එම කුල හතර හෙවත් චතුර්වර්ණය වන බව.
- ඒ ඒ කුලයන්ට අයත් කාර්යයන් පහත සඳහන් පරිදි වූ බව.
  බ්‍රාහ්මණයන් - ඉගෙනීම, ඉගැන්වීම, යාගකිරීම, යාග කරවීම, දන්දීම, දන් පිළිගැනීම.
  ක්ෂත්‍රියයන් - රාජ්‍ය පාලනය දන්දීම යාග කිරීම, ඉගෙනීම,කාමයෙහි නොඇලී ක්‍රියා කිරීම.
  වෛශ්‍යයන් සත්ව පාලනය, දන්දීම, යාග කිරීම, ඉගෙනීම, වෙළදාම, මුදල් පොලියට දීම, කෘෂිකර්මාන්තය
  ශුද්‍රයන් - ඉහත දක්වන ලද කුලවලට අයත් කුඩු මහත් සේවාවන් කිරීම
- ආපදා අවස්ථාවකදී බ්‍රාහ්මණයාට - ක්ෂත්‍රිය , වෛශ්‍ය යන කුල දෙකට අයත් කටයුතුවල නිරතවිය හැකි බව
- අනෙක් වර්ණ වලට පහළ ශ්‍රේණියක වැඩ කිරීමට හැකිවන අතර ශුද්‍රයාට එම ඉඩ ප්‍රස්ථාව අහිමි බව හා එමගින්ද බ්‍රාහ්මණ අයිතිය දැඩිව තහවුරු කර ඇති බව.
- ආශ්‍රම ධර්ම නමින්, පුද්ගලයාගේ ජීවිතයද අවස්ථා හතරකට බෙදා තිබුණ අතර හා ඒවා පහත සඳහන් බව.
  - බ්‍රහ්මචාරි - බ්‍රහ්මචාරියකු වශයෙන් කුඩා කල වේද ඉගෙනුම
  - ගෘහස්ථ - ගෘහ ජීවිතයක් ගත කරමින් පස්කම් සුව අනුභව කිරීම.
  - වාන ප්‍රස්ථ- දරු මුණුබුරන් ලද පසු තවුස් දිවියක් ගෙවීම(අඹුසැමියන් වනගතව)

- සන්න්‍යාසි - අනගාරිකව තවුස් දිවියක් ගත කිරීම.

- ජීව විද්‍යාත්මක , සමාජ විද්‍යාත්මක , ආචාර විද්‍යාත්මක සහ ඓතිහාසික ආදී සාධක ඇසුරෙන් බුදු සමය, වර්ණ ධර්ම සංකල්පය විචාරයට ලක් කරන බව.
- බ්‍රහ්මචාරීබව ජීවිතයේ එක් යුගයකට පමණක් සීමා කිරීම බුදු සමය ප්‍රතික්ෂේප කරන බව
- ඇතැම් ආශ්‍රම ධර්ම වලින් අපේක්ෂා කර ඇත්තේ කාම සේවනයෙන් ඇත්වීම වුවද අභිනිෂ්ක්‍රමණය ඊට වඩා උසස් බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:** පියවර.1 බ්‍රාහ්මණ වර්ණ ධර්ම සංකල්පය නම් කොට ඒ පිළිබඳව බෞද්ධ මතය දක්වන්න. ගුරුභවතා විසින් කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් පරිදි ශිෂ්‍යයන් මෙහෙයවන්න.

පියවර 2. සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න. එක් එක් කණ්ඩායමට වර්ණ ධර්ම ප්‍රතික්ෂේපය කිරීම සඳහා බුදු සමය හඳුන්වා දී ඇති ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක ආචාර විද්‍යාත්මක සහ ඓතිහාසික සාධක වෙන් කොට දෙන්න.

සිසුන් විවිධ පත පොත භාවිතයෙන් කරුණු ගවේෂණයට යොමු කරන්න.

පියවර 3. සිසුන් සොයාගත් තොරතුරු ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවස්ථාව දෙන්න.
එකී ඉදිරිපත් කිරීම් පිළිබඳ සාකච්ඡා කර කරුණු තහවුරු කිරීමට උදව් කරන්න.

**පැවරුම** : "සමාජ සාධාරණත්වය උදෙසා වර්ණ ධර්ම ප්‍රතික්ෂේප කිරීම බුදු සමය ජනප්‍රිය වීමට හේතුවක් විය." යන මාතෘකාව යටතේ රචනා එකතුවක් ලබාගෙන හොඳම රචනා ඇගයීම.

**මූලාශ්‍ර** : ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තය (මනුස්මෘතිය)
අස්සලායන සූත්‍රය (මජ්ඣිම නිකාය)
කණ්ණකත්ථල සූත්‍රය (මජ්ඣිම නිකාය)
සාමඤ්ඤඵල සූත්‍රය (දීඝ නිකාය)
වාසෙට්ඨ සූත්‍රය (මජ්ඣිම නිකාය)
මධුර සූත්‍රය (මජ්ඣිම නිකාය)
අග්ගඤ්ඤ සූත්‍රය (දීඝ නිකාය)

**නිපුණතා මට්ටම 1.2** : භාරතීය සමාජය තුළ කාන්තාවට හිමිවූ තැන විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 24

**ඉගෙනුම් ඵල** :
- කාන්තාව අවම කොට නොසලකා ඇයට නිසි තැන ලබා දෙයි.
- කාන්තා අයිතිවාසිකම් සුරකියි.
- කාන්තා නිදහස අගය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

## 1.2.1 ප්‍රාග් වෛදික චින්තනය තුළ කාන්තාව:

- පූර්ව වෛදික යුගයේ කාන්තාවට සැලකිය යුතු නිදහසක් තිබූ නමුත් පශ්චාත් වෛදික අවධියේ දී එය නැති වු බව.

## 1.2.2 වෛදික චින්තනය තුළ කාන්තාව

- සැමියා මළ කල්හි භාර්යාව සති පූජා පැවැත්විය යුතු බව.
- ළදරු වියේදී දෙමාපියන් යටතේ ද, තරුණ වියේ දී ස්වාමි පුරුෂයා යටතේ ද, මහලු වයසේ දී දරුවන් යටතේ ද ජීවත් විය යුතු බව.
- වෛදික චින්තනය තුළ කාන්තාවට සමාජික, ආර්ථික, දේශපාලනික හා ආගමික නිදහස අහිමි කර තිබූ බව.
- කාන්තාව විශ්වාස නොකටයුතු පහත් දුසිරිත්හිම යෙදෙන තැනැත්තියක සේ සැලකූ බව.

## 1.2.3 බෞද්ධ චින්තනය තුළ කාන්තාව:

- භික්ෂුණියක වශයෙන් කාන්තාවට පැවිද්දෙහි උපරම ඵල නෙලා ගැනීමට අවස්ථාව සලසා ඇති බව සහ තෙරවරුන්ට මෙන්ම තෙරණියන්ටද අගතනතුරු ප්‍රදානය කර ඇති බව.
- උපාසිකාවක වශයෙන් බෞද්ධ සමාජයෙහි ස්ත්‍රියට උසස් තැනක් හිමිවී ඇති බව.
- මවක වශයෙන් ස්ත්‍රිය පූජනීයත්වයෙන් සලකා ඇති බව.
- බිරිඳක වශයෙන් ඇයට නිසි සමාජ තත්ත්වයක් ලබා දී ඇති බව.
- දියණියක වශයෙන් පුතණුවන්ට හා සමාන තත්ත්වයක් ලබා දී තිබෙන බව.
- ප්‍රඥා ප්‍රතිලාභයට සහ ආධ්‍යාත්මික ප්‍රගතියට ස්ත්‍රී භාවය බාධාවක් නොවන බව.

පියවර 1 : භාරතීය සමාජය තුළ කාන්තාවට හිමි වූ ස්ථානය පිළිබඳව සරල පැහැදිලි කිරීමක් කරන්න.

පියවර 2 මූලාශ්‍රයන්හි සඳහන් කරුණු ගවේෂණයට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| පියවර 3 | සිසුන් කරුණු රැස් කිරීමෙන් පසු කෙටි මාතෘකා කිහිපයක් පියවර 1ට අදාළව සකස් කර සිසුන්ට අහඹු ලෙස තෝරා ගන්නට සලස්වන්න. |

පැවරුම

විනාඩි පහක පමණ ක්ෂණික කථාවක් පවත්වන්නට සියලුම සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**මූලාශ්‍රය** :

හික්ඛුනී සංයුක්තය (සංයුක්ත නිකාය)
කෝසල සංයුක්තය ( ධීතු සූත්‍රය - සංයුක්ත නිකාය)
නිවන් මග - කාන්තා විමුක්ති අංශය - රජයේ මුද්‍රණාලය ප්‍රකාශනයකි)
භික්ෂුණීවංසය - උඩරුගමුවේ වංගීස හිමි

**නිපුණතා මට්ටම 1.3** : ෂට් ශාස්තෲන් ඇතුලු ශ්‍රමණ ගුරුකුලවල පහළවීම බමුණන් ඇති කළ සමාජ පීඩනයද හේතු කොට ගෙන ඓතිහාසිකව සිදුවූ බව වටහා ගනිමින් ශ්‍රමණ, බ්‍රාහ්මණ විශේෂතා හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 19

**ඉගෙනුම්ඵල** : ගතානුගතිකත්වයෙන් මිදීමේ වටිනාකම තේරුම්ගෙන කටයුතු කරයි. සිත දියුණු කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරමින් කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

## 1.3.1 ෂට් ශාස්තෲවරුන්ගේ ඉගැන්වීම් සහ සෙසු ශ්‍රමණ ගුරු කුල හඳුනා ගැනීම

- පූර්ණ කස්සප - කුසලාකුසල කර්ම ප්‍රතික්ෂේප කරන මෙතුමා අකිරිය වාදියෙකි.
- මක්ඛලීගෝසාල - සියල්ලම, නියත ස්වභාවික පිළිවෙලකට ඉබේ සිදුවන්නේයයි ප්‍රකාශ කළ මෙතුමා නියතිවාදියෙකි.
- අජිත කේසකම්බලී - මෙතුමා භෞතිකවාදියෙකි. කර්ම විපාක බැහැර කරන අකිරියවාදියෙකි.
- පකුධ කච්චායන - මෙතුමා අකිරියවාදියෙකු මෙන්ම භෞතික වාදියෙකු ද වේ.
- සංජය බෙල්ලට්ඨිපුත්ත - කවර ප්‍රශ්නයකට වුවද ස්ථිර පිළිතුරක් නොදෙන අමරා වික්ඛේපවාදියෙකු ලෙස හැඳින්වේ.
- නිගණ්ඨ නාතපුත්ත - චතුයාම සංවරයක් පිළිබඳව ඉගැන්වූ මෙතුමා ආත්මවාදියෙකු හා පරම අවිහිංසා වාදියෙකු ලෙස හැඳින්වේ.
- පූරණ කස්සප ආදී ෂට් ශාස්තෲන් හැරුණු විට පර්බ්‍රාජක, අචේලක, ආජීවක, ජටිල ආදී වශයෙන් ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ගුරුකුළ රැසක් පැවති බව.

## 1.3.2 බ්‍රාහ්මණ සංස්කෘතිය හා එහි විශේෂිත ලක්ෂණ:

- ක්‍රිස්තු පූර්ව හයවන සියවස වනවිට භාරතීය සමාජ සංවිධානයෙහි ආධිපත්‍යය හිමිකරගෙන සිටියේ බ්‍රාහ්මණයන් විසින් බව.
- ඔවුන්ගේ මූලික ආගමික අදහස් ඇතුළත් සාහිත්‍යය වූයේ වේදය වන අතර, සමාජ සංවිධානය හා මෙහෙයවීම සිදුවූයේද වේද ඉගැන්වීම් අනුව බව.
- සමාජ ව්‍යුහය බ්‍රහ්ම නිර්මාණයක් වශයෙන් පිළිගෙන තිබුණ බව.
- වේද ඉගැන්වීම් අනුව ක්‍රියාකළ බ්‍රාහ්මණයන් බ්‍රහ්ම සහව්‍යතාවය උතුම් ම සැපත ලෙස පිළිගත් බව.
- පරම සැපත උදාකර ගත හැක්කේ කර්ම මාර්ගයට අයත් යාග හෝම ආදී බාහිර ආගමික ක්‍රියා මගින් යයි පිළිගත් බව.

- දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධතාවය පවත්වන්නේ බ්‍රාහ්මණයෝය යන පිළිගැනීම පැවති බව.
- මෙලොව වශයෙන් විවිධ සම්පත් ලබා ගැනීමටත් බ්‍රහ්ම සහව්‍යතාවය ලබා ගැනීමටත් යාග හෝම කළ යුතු යැයි ඉගැන්වූ බව.

### 1.3.2.1 ශ්‍රමණ සංස්කෘතිය හා එහි විශේෂ ලක්ෂණ

- ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ භාරතයේ පැවති බ්‍රාහ්මණ ධර්මයට පටහැනිව ගිය සංස්කෘතිය ශ්‍රමණ සංස්කෘතිය නමින් හැඳින්වෙන බව.
- බ්‍රාහ්මණ සංස්කෘතියේ පිළිගත් වේදය ශ්‍රමණ සංස්කෘතියෙන් ප්‍රතික්ෂේප වන බව
- ශ්‍රමණ ධර්මයෙහි ආගමික චින්තාවන් හා ප්‍රතිපදාවන් වඩාත් නැඹුරු වූයේ ඥාණ මාර්ගය වෙත බව.
- දුෂ්කර ව්‍රත සමාදානයෙන්, විවේකීව සිත දියුණු කිරීමෙන් හා තර්කනයෙන් ඥාණය උපදවා එමගින් විමුක්තිය ලද හැකියයි විශ්වාස කළ බව.

**පියවර** 1

බ්‍රාහ්මණ හා ශ්‍රමණ වශයෙන් සමාජ දෙකක් පැවති බවත්, එම සමාජයන්ට ආවේණික වූ ලක්ෂණ වලින් යුත් සංස්කෘති පැවති බවත් සිසුන්ට පැහැදිලි කරන්න. ඒවායේ ඉගැන්වීම් සමාජයට අහිතකර හා හිතකර අන්දමින් බලපෑම් ඇතිවූ බවට සිසුන් දැනුවත් කරන්න.

පියවර 2

සිසුන් කණ්ඩායම් තුනකට බෙදා

1 ෂට් ශාස්තෘන්ගේ හා ඔවුන්ගේ ඉගැන්වීම්
2. බ්‍රාහ්මණ සංස්කෘතිය හා එහි විශේෂ ලක්ෂණ
3. ශ්‍රමණ සංස්කෘතිය හා එහි විශේෂ ලක්ෂණ යන මාතෘකා පවරන්න.

ඔවුන්ට ගවේෂණයේ යෙදෙමින් කරුණු එක්රැස් කරන්නට උපදෙස් දෙන්න.
මූලාශ්‍රය ග්‍රන්ථ පරිහරණයට උපදෙස් දෙන්න.

පියවර 3

කණ්ඩායම් රැස්කළ කරුණු පන්තියට අනාවරණය කරන්න.
තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳ මග පෙන්වා දෙන්න.

පැවරුම : වෙන් වෙන්ව සකසන ලද පුවරු තුනක අදාළ කරුණු සංග්‍රහ කොට පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**මූලාශ්‍රය** :

සාමඤ්ඤඵල සූත්‍රය (දීඝ නිකාය)
මක්ඛලී සූත්‍රය (අංගුත්තර නිකාය)
යඤ්ඤ සූත්‍රය (සංයුක්ත නිකාය)
නානාතිත්ථිය සූත්‍රය (උදාන පාලිය)
සත්ත ජටිල සූත්‍රය (සංයුක්ත නිකාය)
භාරතීය සංස්කෘතික ඉතිහාසය (රොලින්සන්)
බුද්ධ ධර්මය, සමාජය හා සංස්කෘතිය - අත්තුඩාවේ රාහුල හිමි
බෞද්ධ සංස්කෘතියේ පසුබිම හා මූලධර්ම (දේවාලේගම මේධානන්ද හිමි.)

**නිපුණතා මට්ටම 1.4** : රාජාණ්ඩු පාලනයේ නැගීම, ගෝත්‍රික රාජ්‍යයන්ගේ බිඳ වැටීම, සිටුවර පන්තියේ නැගී සිටීම හා නාගරීකරණය පිළිබඳ අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25

**ඉගෙනුම් ඵල** : ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරයි.
රටක පාලනය ප්‍රජාතන්ත්‍රීයවීම අගයයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

## 1.4.1 කෝසල, මගධ, වත්ස, අවන්ති යන රාජාණ්ඩු

### 1.4.1.1 කෝසල රාජ්‍යය:

- මුල් අවධියේ දී දුර්වල රාජ්‍යයක්ව පැවති කෝසලය වීර කාව්‍ය යුගයේ ප්‍රධාන නගරයක් ලෙස ප්‍රකට වූ බව.
- පසු කලක ප්‍රබල අධිරාජ්‍යයක් බවට පත්වූ එය බරණැස හා සාකේත රාජ්‍යයද ඇතුළත් විශාල ප්‍රදේශයක් පුරා පැතිර ගිය බව.
- මෙහි අගනුවර සැවැත්නුවර වූ අතර බුද්ධ කාලීන පාලකයා පසේනදී කෝසල රජතුමා වූ බව.
- මෙහි රාජාණ්ඩු ක්‍රමය පැවති බව.

### 1.4.1.2 මගධ රාජ්‍යය:

- චම්පා, සෝණ යන නදීන්ගෙන් සීමාවූ මගධය උතුරෙන් ගංගා නදියටත්, බටහිරින් වින්ධ්‍යා කඳුවැටියටත් සීමාවූ බව
- රජගහ නුවර මෙහි අගනුවර වූ අතර බිම්බිසාර හා අජාසත් යන රජවරුන් බුද්ධ කාලීන පාලකයන් වූ බව.
- වේභාර, වේපුල්ල, ගිජ්ඣකූට,ඉසිගිලි,පාණ්ඩව යන පර්වත පහකින් වටවී පිහිටි නිසා 'ගිරබ්බජ' යන නමින් ද ප්‍රකටව පැවති බව.
- මෙහිද රාජාණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වූ බව

### 1.4.1.3 වත්ස රාජ්‍යය:

- අවන්ති ජනපදයට උතුරෙන් යමුනා නදිය අසබඩ වත්ස රාජ්‍යය පිහිටි අතර කොසඹෑ නුවර මෙහි අගනගරය වූ බව.
- බුද්ධ කාලයේ ප්‍රසිද්ධ රාජ්‍යයක් වූ මෙහි එකල පාලකයා වූයේ උදේනි රජු බව.
- මෙහි ද රාජාණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වූ බව.

### 1.4.1.4 අවන්ති රාජ්‍යය

- බටහිරින් පිහිටි ඉන්දු මිටියාවත ඔස්සේ විහිදුණු අවන්තිය බුද්ධකාලය වනවිට සාරවත් රාජ්‍යයක් ලෙස පැවති බව හා එකල මෙහි පාලකයා වූයේ චණ්ඩපජ්ජෝත රජු බව
- මෙහි ද රාජාණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වූ බව.

- පැරණි අවන්ති රාජ්‍යයේ අගනුවර උදේනිය වූ බව
- මෙම රාජාණ්ඩු බිහිවීම නිසා ගෝත්‍රික රාජ්‍යයන්ගේ බිඳවැටීම සිදුවූ බව.

### 1.4.2. වාණිජකරණය

- කෘෂිකර්මාන්තයත්, වෙළඳාමත්, පැරණි භාරතයේ ප්‍රධානතම ධනෝපායන ක්‍රමය වු බව හා ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තරවද වෙළඳ ගනුදෙනු පවත්වා ගැනීමෙන් භාරතය කීර්තියට පත්වූ බව.
- ජාතික වශයෙන් ගැල් සිය ගණන් යොදවා වෙළඳාමෙහි යෙදුන සාත්තුනායක වෙළඳුන් පිළිබඳව අපණ්ණක , වණ්ණුපථ වැනි ජාතක කථාවල සඳහන් වන බව.
- රට අභ්‍යන්තරයේ, කොසඹෑනුවර, පැලලුප්නුවර, වැනි සුප්‍රකට වෙළඳ නගර ගොඩ නැගුණු බව හා භාරතයේ සිට භාරුකච්ච හරහා බුරුමයටත්, බැබිලෝනියාවටත්, සෝවීර රාජ්‍යයටත්, නැව්මගින් වෙළඳ භාණ්ඩ නිර්යාත කළ බව

### 1.4.3 නාගරීකරණය

- මුදල් භාවිතය සමග නව පන්තියක් සිටුවරුන් බිහිවූ බව.
- මුදල් භාවිතය පැතිර යාමත් සමග පැරණි භාරතය ක්‍රමයෙන් වාණිජකරණයට හා නාගරීකරණයට යොමුවු බව
- වාණිජකරණය හා නාගරීකරණයත් සමග සාම්ප්‍රදායික වෛදික විශ්වාස කෙමෙන් බිඳ වැටෙන්නට පටන්ගත් බව.
- බුද්ධකාලීනව ඉතා දියුණු වෙළඳ නගර හා වෙළඳ මාර්ග පිළිබඳව මූලාශ්‍රවල තොරතුරු සඳහන්ව ඇති බව.

**පියවර** 1. බුද්ධ කාලීන භාරතීය මහා රාජ්‍ය සංකල්පය පැහැදිලි කරන්න. එකල පැවති මහා රාජ්‍ය හතරක් සම්බන්ධයෙන් හැඳින්වීමක් කර පහත සඳහන් පරිදි කරුණු රැස් කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 2. රාජ්‍යයේ සීමා, බුද්ධකාලීන රජවරු, එම රජවරුන් බුදුරදුන් සමග හා වෙනත් ආගමික නායකයන් අතර පවත්වාගත් සම්බන්ධතා, ඒ ඒ රාජ්‍යවල පැවති ප්‍රධාන නගර හා ඒවායේ සිටි සිටුවරුන්

පියවර 3. සිසුන් තොරතුරු එක් රැස්කළ පසු කණ්ඩායම් හතරකට වෙන් කොට රාජ්‍ය හතරක් සම්බන්ධ කරුණු ගොනු කරන්නට උපදෙස් දෙන්න.

පැවරුම : එකී තොරතුරු රාජ්‍ය හතරට වෙන් වෙන්ව වගුවක් සකස් කොට පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**මූලාශ්‍රය** :

බුද්ධ ධර්මය සමාජය හා සංස්කෘතිය - අත්තුඩාවේ රාහුල හිමි
උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ශාසන ඉතිහාසය - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
භාරතයේ මුල් අවස්ථාව - ජිනදාස කපුගේ
බෞද්ධ භාරතය - රීස් ඩේවිඩ්ස්
බෞද්ධ ශිෂ්ටාචාරයේ ඉතිහාසය - චන්දිම විජේබණ්ඩාර
එම්.එම් . මොරටුවගම

**නිපුණතාව 2.0** : පුද්ගලයා හා සමාජය පිළිබඳ බෞද්ධ මතය වටහාගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් ඵල** : සියල්ල පරිණාමය වන බව වටහාගෙන ක්‍රියා කරයි.
සමාජ ප්‍රභවය හා විකාශය පටිච්ච සමුප්පාද මූලධර්මය මත සිදුවූ බවට කරුණු ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

## 2.1.1: සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය :

- සමාජ ප්‍රභවය හා විකාශය පටිච්ච සමුප්පාද මූල ධර්මය මත පදනම් ව ඇති බව හා පාරිසරික සාධක මෙන්ම මනෝ විද්‍යාත්මක සාධක ද ඒ කෙරෙහි බලපා ඇති බව
- සමාජ විෂමතාවන්ගේ ප්‍රභවය පරිණාමවාදීව විග්‍රහ කරන බව.
- පුද්ගලයා සිය ගැටලුවලට විසඳුම් සෙවීම තුළින් ආර්ථික දේශපාලන, ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථා නිර්මාණය වන බව.

පියවර 1. සමාජයේ හටගැන්ම හා විකාශය පිළිබඳව මානව විද්‍යාත්මක අදහස් දක්වමින් සිසුන් දැනුවත් කරන්න.

පියවර 2. සමාජයේ ප්‍රභවය හා විකාශය පිළිබඳව සිසුන්ට මූලාශ්‍ර ගත කරුණු අධ්‍යයනයෙන් තොරතුරු සපයා ගැනීමට උපදෙස් දෙන්න.
මේ සඳහා පුස්තකාලය පරිහරණය කිරීමේ හෝ වෙනත් කාලීන සම්පත් උපයෝගී කරගැනීමේ වටිනාකම පෙන්වා දෙන්න.
සමාජ ප්‍රභවය සිදුවූ අයුරු දැක්වෙන විද්‍යාත්මක ලිපි පරිශීලනය කරන්නට සිසුන් මෙහෙයවන්න.

පියවර 3. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
පහත සඳහන් මාතෘකාව යටතේ කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න.

පැවරුම : "සමාජ ප්‍රභවය සම්බන්ධයෙන් බුදු දහම ඉදිරිපත් කරන සාධක - නවීන විද්‍යාත්මක සොයා ගැනීම් වලින් ද තහවුරු වේ" යන්න සනාථ කෙරෙන ලිපියක් ලියයි.

**මූලාශ්‍රය** :

අග්ගඤ්ඤ සූත්‍රය (දීඝ නිකාය)
සිගාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
බෞද්ධ සමාජ ධර්මය ( හේමචන්ද්‍ර විජේසේකර)
බෞද්ධ සදාචාරයේ මූලධර්ම ( ගුණපාල ධර්මසිරි)
බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය ( චන්දිම විජේබණ්ඩාර)
බුදු දහම හා එහි ආගමික පසුබිම ( ආචාර්ය ඩබ්. ජ්. වීරරත්න)
බෞද්ධ සමාජ දර්ශනය සහ සමාජ දර්ශනය ( උඩගලදෙණියේ සෝමරංසි හිමි)
උසස් පෙළ බුද්ධ ධර්මය ( කොස්වත්තේ අරියවිමල හිමි)
බෞද්ධ සමාජ දර්ශනය ( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
නිවන් මග සඟරාව (පංචසීල විමර්ශන - 9 කලාපය)
ආදි බෞද්ධ දර්ශනය මූලධර්ම විග්‍රහයක් ( සුමනපාල ගල්මන්ගොඩ)

**නිපුණතා මට්ටම 2.2** : පුද්ගලයාගේ ස්වාමිත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18

**ඉගෙනුම් ඵල** : බුදු දහමෙහි එන පුද්ගල ස්වාධීනත්වය ඇගයුමට ලක් කරයි.
පුද්ගල ශක්තිය අගය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

## 2.2.1 පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම්

- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සර්ව බලධාරී ඊශ්වරයකු විසින් සත්වයා හා ලෝකය මවා පාලනය කරන්නේ යයි උගන්වන බව.
- නිර්මාණවාදය පිළිගැනීම තුළින් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය නිෂේධනය වන බව.
- බෞද්ධ හේතුඵල ධර්මයෙන් ඊශ්වර නිර්මාණවාදය බැහැරවන බව.

## 2.2.2 පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

- මිනිසාගේ ස්වාමිත්වය මිනිසාට පවරා ඇති බව හා බාහිර ගැලවුම්කරුවකු මත රඳවා නොමැති බව.
- අත්තකාර, පරකාර, ආරම්භධාතු, නික්ඛම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යන ඉගැන්වීම් මගින් පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන බව.
- කවර හෝ අදෘශ්‍යමාන නියතියකට පුද්ගල පෞරුෂය යටත් නොකොට ස්වච්ඡන්දතාව හා වගකීම අර්ථවත් කොට ඇති බව.

පියවර 1. මිනිසාගේ උපත තනිව සිදුවන බවත් මරණය ද තනිවම සිදුවන බවත් ආකර්ශනීය අයුරින් සිසුන්ට ඉදිරිපත් කරන්න. එසේ වූ මිනිසා කිනම් ආකාරයකින් උපත - විපත අතර කාලය ගත කළ යුතුද යන්න සාකච්ඡා කරන්න.

පියවර 2. පුද්ගල ශක්තිය හාස්වාධීනත්වය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් හා පුද්ගල ශක්තිය හා ස්වාමිත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ කරුණු රැස් කරන්නට , සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා පවරන්න.

පියවර 3. කරුණු රැස් කිරීමෙන් පසු ශිෂ්‍ය කණ්ඩායම් වල ට පහත මාතෘකා ලබා දෙන්න.

- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පාලනය කරයි.

- බෞද්ධ ඉගැන්වීම් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය කරයි.

පැවරුම : ඉහත මාතෘකා දෙක යටතේ බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් සංවිධානය කරන්න.

**මූලාශ්‍රය** :අත්තකාර සූත්‍රය ( අංගුත්තර නිකාය)
160,161 ගාථා (ධම්මපදය - බුද්දක නිකාය)
අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය (මජ්ඣිම නිකාය)
තිත්ථායතන සූත්‍රය ( අංගුත්තර නිකාය)
දේවදහ සූත්‍රය (මජ්ඣිම නිකාය)
චුල්ලකම්ම විභංග සූත්‍රය (මජ්ඣිම නිකාය)
කාලාම සූත්‍රය (අංගුත්තර නිකාය)
බෞද්ධ සංස්කෘතිය-පසුබිම හා මූලධර්ම(දේවාලේගම මේධානන්ද හිමි)
මුල් බුදුසම හා විවරණ ගැටලු (පාතේගම ඤාණාරාම හිමි)
උසස් පෙළ බුද්ධ ධර්මය ( කොස්වත්තේ අරියවිමල හිමි)

**නිපුණතාව 3.0** : බෞද්ධ ඉගැන්වීම් දේශපාලන හා සමාජ සංවිධානවල යහපැවැත්ම පිණිස උපයෝගීවන ආකාරය විමර්ශනය කර යහ පාලනයට දායක වේ.

**නිපුණතා මට්ටම 3.1** : රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ ඉගැන්වීම් යොදා ගත හැකි ආකාරය පිළිබඳ ව දැනුවත් බවක් ඇතිවෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 32

**ඉගෙනුම් ඵල** : රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වත්මන් ලෝකයටද අදාළ කරගත හැකි බව වටහා ගනියි.
සාර්ථක පාලකයකු වීම සඳහා අවශ්‍ය ගුණාංග ඇගයීමට ලක් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

## 3.1.1: දසරාජ ධර්ම :

- පාලකයකු තුළ පැවතිය යුතු පෞරුෂ ලක්ෂණ 10ක් මේවායින් ප්‍රකාශ වන බව
- දසරාජ ධර්මයන් වලින් එකක් වූ මද්දව යන්න මජ්ජව ලෙස දැක්වීම වැරදි බව

## 3.1.2 දස සක්විති වත්

- සක්විතිවත් නම් සක්විති රජකු අනුගමනය කරන පිළිවෙත් සමූහයක් බව
- දසයක් වශයෙන් දැක්වෙන සක්විතිවත් මූලික සංකල්ප හතරකට පහත සඳහන් පරිදි සංග්‍රහ කළ හැකි බව.
  - සිවුපාවන් පක්ෂීන් සහිත සියලු ජනතාවට දැහැමි රැකවරණය සැලසීම
  - අධාර්මික ක්‍රියාවලට ඉඩ නොතැබීම.
  - ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීම
  - විශාරදයන්ගේ උපදෙස් ලබා ගැනීම
- සක්විතිවත්වල මූලික ලක්ෂණය ධර්මය හෙවත් මනුෂ්‍ය ධර්මය නොඉක්මවීම බව
- මනුෂ්‍යයන්ගේ පමණක් නොව මෘග පක්ෂීන්ගේ පවා ආරක්ෂාව සැලසිය යුතුය යන්න බෞද්ධ ඉගැන්වීම බව
- ආර්ථික සුරක්ෂිතතාව නැතිවීම නිසා සමාජ ව්‍යුහයම බිඳ වැටෙන අයුරු බෞද්ධ ඉගැන්වීමෙහි දැක්වෙන බව

## 3.1.3 සප්ත අපරිහානිය ධර්ම :

- වජ්ජි රාජ්‍යයේ පාලකයන් අපරිහානීය ධර්ම සුරකින තාක් කල් එම රාජ්‍ය සංවර්ධනයක් මිස පිරිහීමක් නොවූ බව.
- එම අපරිහානීය ධර්ම වජ්ජීන්ට ඉගැන්වූයේ බුදුරදුන් බව.
- ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික ලක්ෂණ රැක ගැනීමට වුවමනා කැරෙන ආචාර ධර්ම හතක් අපරිහානීය ධර්මවලින් ඉදිරිපත් කෙරෙන බව.

## 3.1.4 සතර සංග්‍රහ වස්තු :

- ජන සෙත සඳහා පාලකයකු ක්‍රියාත්මක කළ යුතු සුබ සාධක ක්‍රමය සතර සංග්‍රහ වස්තුවෙන් ප්‍රකට වන බව
- රිය සකට කඩ ඇණය මෙන් සමාජයේ යහ පැවැත්මට සතර සංග්‍රහ වස්තුව උපයෝගී වන බව

## 3.1.5 සතර අගති :

- පුද්ගලයින් අගතියට යැමට හේතුවන කරුණු හතරක් හා පාලකයකු ඒවායින් වැලකීමේ අවශ්‍යතාව සතර අගතිය පිළිබඳ ඉගැන්වීමෙන් ප්‍රකට වන බව
- පාලක පක්ෂය කවර හේතුවක් නිසාවත් අගතිගාමී නොවී ක්‍රියා කළ යුතු යයි මෙයින් ඉගැන්වෙන බව

පියවර 1. රාජ්‍ය පාලනයේ විධිමත්භාවය රටක හා එහි පුරවැසියාට විවිධ ආකාරයෙන් සුරක්ෂිත භාවයක් ඇති කරන බව සිසුන්ට පවසන්න. වර්තමාන පාලන තන්ත්‍රයේ යහපත් අංග අගය කරන්න. බෞද්ධ ඉගැන්වීම මගින් යහ පාලනයකට කරුණු ඉදිරිපත් කර ඇති බවත් ඒවා අධ්‍යයනයේ ඇති වැදගත්කමත් සිසුන්ට පහදා දෙන්න.

පියවර 2. සප්ත අපරිහානිය ධර්ම , දස සක්විතිවත්, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති යන කරුණුවල අන්තර්ගතය ගවේෂණය කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 3. සොයාගන්නා ලද කරුණු රාජ්‍යයක යහ පාලනය උදෙසා යොදාගත හැකි අයුරු සාකච්ඡා කරන්න.

පැවරුම : පන්ති කාමරය පාසල් පාර්ලිමේන්තුවක් බවට පත්කොට ඉහත කරුණු ආශ්‍රයෙන් යහපත් රාජ්‍යයක් උදෙසා වූ පනතක් බෞද්ධ ඉගැන්වීම් තුළින් සකස් කොට විවාදයට ගන්න.

**මූලාශ්‍රය** :

ජාතක පාලියේ 4000 ගාථාව (ජාතක පාලිය)
චක්කවත්ති සීහනාද සූත්‍රය (දීඝ නිකාය)
කූටදන්ත සූත්‍රය ( දීඝ නිකාය)
සාරන්දද සූත්‍රය ( අංගුත්තර නිකාය)
සංගහවත්ථු සූත්‍රය ( අංගුත්තර නිකාය)
අගති නාගති සූත්‍රය ( අංගුත්තර නිකාය)
මහා පරිනිබ්බාණ සූත්‍රය ( දීඝ නිකාය)
බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම ( චන්දිම විජේබණ්ඩාර,එම්.එම්. මොරටුවගම)

**නිපුණතා මට්ටම 3.2** : සිව්වණක් පිරිස පිළිබඳ බෞද්ධ ඉගැන්වීම විමසුමට ලක් කරමින් පුද්ගලයා හා සමාජය අතර ඇති සම්බන්ධය පිළිබඳ බෞද්ධ විග්‍රහය ගෙනහැර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 50

**ඉගෙනුම් ඵල** : පිදියයුත්තන් පිදීමෙහි නිරත වෙයි.
වගකීම් හා යුතුකම් හඳුනාගෙන කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:**

## 3.2.1 භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා

- භික්ෂු, භික්ෂුණී, උපාසක උපාසිකා යනු සිව්වණක් පිරිස බව
- සිව්වණක් පිරිස අතරම පෘථග්ජන සහ ආර්ය ශ්‍රාවකයන් සිටිය හැකි බව

## 3.2.2 භික්ඛු සංඝ හා සාවක සංඝ

- භික්ෂු සංඝ සංඛ්‍යාවට අයත්වන්නේ භික්ෂූන් වහන්සේලා පමණක් බව.
- ශ්‍රාවක සංඝ සංඛ්‍යාවට ඇතුළත් ශ්‍රාවකයන් සිව් පිරිසෙහිම සිටින බව.
- සිව්වණක් පිරිස පිළිබඳ ඉගැන්වීමෙන් බ්‍රාහ්මණයින්ගේ වර්ණ ධර්ම සංකල්පය ප්‍රතික්ෂේප වන බව.

## 3.2.3 සදාචාරාත්මක පදනම

- සීලය සමාජයේ යහ පැවැත්මට අත්‍යවශ්‍ය බව.
- හිරි ඔත්තප්ප නැති සමාජය තිරිසන් තත්ත්වයට පත්වේයැයි බුදු දහමේ ඉගැන්වෙන බව.
- සමාජය දියුණු වීමට නම් පරාභව කරුණු වලින් හා වසලකරණ ධර්ම වලින් ඉවත්විය යුතු බව.

## 3.2.4 අන්‍යෝන්‍ය ගෞරවය හා සුහදතාව

- ගෞරවය (ගාරවෝ) දියුණුවේ ලක්ෂණයක් ලෙස දැක්වෙන බව.
- බෞද්ධ සමාජයේ භේද නොසැලකෙන නිසා සමානාත්මතාව හා සුහදතාව රැකෙන බව.
- ප්‍රියශීලී ලෙස ඔවුනොවුන් දෙස බලමින් කනට මිහිරි සත්‍ය වචනම භාවිතා කරමින් කිරි සහ වතුර මෙන් එකට එකතුව සුහදව ජීවත්වීමේ වැදගත්කම බුදු දහමේ අවධාරණය වන බව.

## 3.2.5 යුතුකම් හා වගකීම් ඉටුකිරීම.

- බෞද්ධ සමාජ සැලැස්ම ඉදිරිපත් කොට තිබෙන්නේ යුතුකම් හා වගකීම් පදනම් කොටගෙන මිස අයිතිවාසිකම් පදනම් කොටගෙන නොවන බව.

- මව්පියන්, දූ දරුවන්, ස්වාමිපුරුෂයන්, භාර්යාවන්, මිත්‍රයින්, සේවකයින්, සේව්‍යයන්, ගිහියන්, පැවිද්දන් ඉටුකළ යුතු යුතුකම් සහ ඔවුනොවුන්ගේ වගකීම් වෙන වෙනම සඳහන් කොට ඇති බව.

- කුමන සමාජ කොටසක හෝ යුතුකම් පැහැර හැරෙන විට එය මුලු සමාජයටම අහිතකර ලෙස බලපාන බව.

### 3.2.6 නීති ගරුකත්වය හා සාමය

- නීති ගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස දැක්වෙන බව.
- සාමූහික ජීවිතයේදී නීති ගරුකත්වයේ අවශ්‍යතාව සික්ෂාපද පැනවීමේ පරමාර්ථ ඇසුරෙන් පැහැදිලි වන බව.
- බුදු දහම තුළ දඬුවම ප්‍රතික්ෂේප නොවන නමුදු එය අපරාධ වැළැක්වීම් එකම පිළියම ලෙස පිළිගෙන නැති බව.
- නීතිය යනු සමාජ සම්මතයක් බව හා සමාජ සම්මතයන් නොඉක්මවා ධර්ම චර්යාවෙහි යෙදිය යුතු යැයි ඉගැන්වෙන බව.
- මිනිසා වරදට පෙළඹෙන හේතු නැතිකොට අපරාධ නැති කිරීම බෞද්ධ පිළිවෙත බව.
- නීතිගරුකවීම සාමූහික පැවැත්මට හා සමගියට මගපාදන බව

### 3.2.7 පුද්ගල වගකීම් සහ යුතුකම් පිළිබඳ බෞද්ධ විග්‍රහය

- පන්සිල් සුරකින විට නීතිය ද සාමය ද සුරැකෙන බව.
- පුද්ගල වගකීම් හා යුතුකම් ඉටුකිරීම මගින් යහපත් සමාජයක් ගොඩනැගිය හැකි බව
- තමා උපමා කොට සිතා අනුන්ගේ අයිතිය රැක දීමේ ක්‍රමය බුදු දහම අනුදත් බව
- අකුසල ධර්ම බැහැර කොට කුසල ධර්මවල යෙදීම බෞද්ධයාගේ වගකීමක් බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1. සමාජයක යහ පැවැත්ම සඳහා වන කරුණු මොනවාදැයි සිසු දැනුම ඇසුරින් සාකච්ජා කරන්න.
සදාචාරය, අන්‍යෝන්‍ය ගෞරවය, සුහදතාව, යුතුකම් , වගකීම් හා නීතිය ඒ සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න.

පියවර 2. ඉහත කරුණු සම්බන්ධයෙන් කාලීන තොරතුරු ඇතුළත් දත්ත රැස් කරන්නට සිසුන් යොමු කරන්න. එසේ රැස්කළ තොරතුරු ඉදිරිපත් කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 3. එම තොරතුරුවලට ආකර්ශනීය සිරස්තල යොදමින් වාර්තා ස්වරූපයෙන් සකස් කරන්නට සිසුන් මෙහෙයවන්න.

**පැවරුම** : එම ලිපි ඇතුලත් බිත්ති පුවත් පතක් නිර්මාණය කරන්න.

**මූලාශ්‍රය** : චරියා සූත්‍රය (අංගුත්තර නිකාය)
පරාභව සූත්‍රය (සුත්ත නිපාතය)
වසල සූත්‍රය ( සුත්ත නිපාතය)
සිගාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (අංගුත්තර නිකාය)
ධම්මික සූත්‍රය (සුත්ත නිපාතය)
යුතුකම - දෙනිපිටියේ සුමනසිරි හිමි

**නිපුණතාව 4.0** : බෞද්ධ ආචාර ධර්ම පිළිබඳ මූලික අවබෝධය ලබා ගනිමින් උභයාර්ථ සාධනයට මග පාදා ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : පින් පව් , කුසල් - අකුසල් හඳුනා ගනිමින් ඒවා නිශ්චය කිරීම පිළිබඳ බෞද්ධ නිර්ණායක පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 24

**ඉගෙනුම් ඵල** : අකුසලින් දුරුව කුසලින් සරුව ජීවත් වෙයි.
යහපත අයහපත හඳුනාගෙන යහපත් කටයුත්තෙහි යෙදෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

## 4.1.1: දස කුසල් හා දස අකුසල්

- සාවද්‍ය ක්‍රියා දහයක් ඇතිබව හා ඒවා දස අකුසල් ලෙස හැඳින්වෙන බව.
- දස අකුසලයෙන් වෙන්ව කටයුතු කිරීම දස කුසලය ලෙස හැඳින්වෙන බව.
- මෙම කුසල් අකුසල් කායිකව, වාචසිකව, මානසිකව යන දොරටු තුනෙන්ම සිදුවන බව

## 4.1.2 දස පින්කිරියවත්

- කළ යුතු පිංකම් දහයක් ද බුදු දහමේ සඳහන් වන අතර ඒවා දස පුණ්‍ය ක්‍රියා ලෙස හැඳින්වෙන බව

## 4.1.3 පින් පව් කුසල් අකුසල් විනිශ්චය කිරීමට අදාළ බෞද්ධ නිර්ණායක

- බුදු දහමේ කුසල් හා අකුසල් අර්ථවත් කිරීම සඳහා පුඤ්ඤ පාප, සම්මා මිච්ඡා , අර්ය අනර්ය, සාධු අසාධු ආදී ඇගයුම් ශීලී පද භාවිත කරන බව.
- පුද්ගල ක්‍රියාකාරකම් ඇගයීමෙහිලා චේතනාව හා විපාකය පූර්වංගම වන බව.
- කුසල අකුසල විනිශ්චයෙහිලා අත්තහිත, පරහිත අත්තාධිපතෙය්‍යා, ලොකාධිපතෙය්‍යා, ධම්මාධිපතෙය්‍යා, විඤ්ඤූපසත්ථ, විඤ්ඤූගරහිත යනාදී අතිරේක කරුණු ද ප්‍රමාණකොටගන්නා බව
- කුසල අකුසල විනිශ්චය කොට ක්‍රියා කිරීමේ නිදහසත් ඒ පිළිබඳ වගකීමත් පුද්ගලයා සතුවන බව.
- ලෝභ, දෝස, මෝහ යන අකුසල් මුල් නිසා ඇතිවන්නේ නරක සිතිවිලි බව.
- අලෝභ, අදෝස, අමෝහ යන කුසල් මුල් නිසා ඇතිවන්නේ යහපත් සිතුවිලි බව
- අකුසල සිතිවිලි නිසා වැරදි ක්‍රියාවලට යොමුවන බව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1. කුසල් - අකුසල් පිළිබඳ නිර්ණායක සිසුන්ට සිහිපත් කරවන්න.
ඉන්පසු එම කරුණු පිළිබඳ විෂය පථය පැහැදිලි කර දෙන්න.

පියවර 2. සියලුම සිසුන්ට එකී විෂය පථය තුළට ගැනෙන සේ කෙටි ප්‍රශ්න 20 බැගින් පිළිතුරු සමග සකස් කරන්නට උපදෙස් දෙන්න.
ඒ සඳහා මූලාශ්‍ර අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.

**පැවරුම :** ඉහත ප්‍රශ්න උදව් කරගෙන ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් මෙහෙයවන්න.

**මූලාශ්‍රය** :

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය (මජ්ඣිම නිකාය)
කාලාම සූත්‍රය (අංගුත්තර නිකාය)
67,68 ගාථා - ධම්මපදය (ඛුද්දක නිකාය)
වේළුද්වාර සූත්‍රය (සංයුක්ත නිකාය)
නිබ්බේදික සූත්‍රය (අංගුත්තර නිකාය)
කුසල සූත්‍රය ( අංගුත්තර නිකාය)
බෞද්ධ සදාචාරයේ මූලධර්ම - ගුණපාල ධර්මසිරි
නිර්වාණය සහ සදාචාරය - දීගල්ලේ මහින්ද හිමි

**නිපුණතා මට්ටම 4.2** : ශ්‍රද්ධාව, ප්‍රඥාව, පුද්ගල සංවර්ධනය හා සමාජ සංවර්ධනය පිළිබඳ බෞද්ධ මතය හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 28

**ඉගෙනුම් ඵල** : ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.
අපිස් ජීවිතයක් ගත කරයි.
පන්සිල් සුරකියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

## 4.2.1: ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස

- බුදු සමයේ ඉගැන්වෙන ශ්‍රද්ධා සංකල්පයේ අර්ථය ප්‍රේමය, ඇලීම, භක්තිය යනාදි පදවලින් ගම්‍ය වන අර්ථ වලට වඩා දියුණු බව.
- බෞද්ධ ශ්‍රද්ධාව, සදාචාර සංවර්ධනය උදෙසා අවශ්‍ය පළමු පියවර වශයෙන් සලකා ඇති බව.

## 4.2.2 ශ්‍රද්ධාව, ප්‍රඥාව හා ආධ්‍යාත්මික සංවර්ධනය

- ශ්‍රද්ධාව අමූලිකා ශ්‍රද්ධා , ආකාරවතී ශ්‍රද්ධා යනුවෙන් කොටස් දෙකකට බෙදන බුදු සමය එහි ආකාරවතී ශ්‍රද්ධාව අගය කොට ඇති බව හා එය ආධ්‍යාත්මික සංවර්ධනයට පසුබිම සකස් කරන බව.
- බෞද්ධ ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොරවූවක් නොවන බව.

## 4.2.3 පන්සිල් ආරක්ෂා කිරීම තුළින් ඇතිවන සමාජ සුරක්ෂිතතාව

- පන්සිල් ගිහි සමාජයේ නිත්‍ය සීලය බව.
- පන්සිල් ආරක්ෂා කිරීමෙන් සමාජ විරෝධී ක්‍රියා වළක්වා ගත හැකි බව.
- සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කළ හැකි බව.

## 4.2.4 පුද්ගල හා සමාජ අභිවෘද්ධියට හිතකර වූ අල්පේච්ඡතාව

- මහිච්ඡතාව හා අතෘප්තිකර බව යනු පුද්ගලයාගේ හා සමාජයේ සහජ ස්වභාවයක් බව.
- කහවනු වැස්සකින් වුවද, තෘප්තිමත් නොවන මිනිසා තණ්හාවට දාසයෙක් වන බව.
- ආශාවන් නොව අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට මග පෙන්වන බුදු දහම ඒ තුළින් තෘෂ්ණාව පාලනය කිරීම ද තෘප්තිමත් දිවිපැවැත්ම ද අවධාරණය කරන බව.
- අධික තෘෂ්ණාව විවිධ සමාජ ගැටලු ඇතිවීම විෂයෙහි බලපාන බව භෞතික සම්පත් පරිහරණය ජීවිතයේ නිෂ්ටාව නොව නිෂ්ටාව සඳහා වූ මාධ්‍යයක් ලෙස සලකන බව.

- පුද්ගල ජීවිතයේ නිදහස හා සතුට පිණිස බහුකෘත්‍යතාව බාධකයක් වන බව සහ නිර්වාණාභිලාශී පුද්ගලයා විසින් අල්පකෘත්‍යතාව පුහුණු කටයුතු බව.
- කායික හා මානසික සෞඛ්‍ය සඳහා අල්පේච්ඡතාව අල්ප කෘත්‍යතාව හා යථාලාභ සන්තුෂ්ටිය වැදගත් සාධක වන බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1. අප සතුව ඇත්තේ භක්තියද ශ්‍රද්ධාවද යන්න සිසුන්ගෙන් විමසන්න. භක්තිය බුදු සමයෙන් ඇගයීමට ලක් නොවන බවත්, අවශ්‍ය වන්නේ තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාව බවත් ශිෂ්‍යයන්ට පහදා දෙන්න. පුද්ගල සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට අවශ්‍ය කරුණු ද නිර්දේශිත මූලාශ්‍ර අධ්‍යයනයට මග පෙන්වන්න.

පියවර 2. සිසුන් ගවේෂණයෙන් සපයාගත් තොරතුරු ඉදිරිපත් කරන්නට අවස්ථාව දෙන්න. ශ්‍රද්ධාව හා භක්තිය පිළිබඳ වෙනස, සමාජ සංවර්ධනයට පංචශීලයේ උපයෝගීතාව සාකච්ඡා කරන්න.

පියවර 3. සිසුන් අදාළ පරිදි කණ්ඩායම් කර පහත සඳහන් පැවරුමෙහි යොදවන්න.

පැවරුම : "පුද්ගල සංවර්ධනය - සමාජ සංවර්ධනයයි" යන මාතෘකාව යටතේ කෙටි රචනාවක් ලියවීම.

**මූලාශ්‍රය** : කීටාගිරි සූත්‍රය (මජ්ඣිම නිකාය)
වංකී සූත්‍රය (මජ්ඣිම නිකාය)
වීමංසක සූත්‍රය (මජ්ඣිම නිකාය)
රට්ඨපාල සූත්‍රය (මජ්ඣිම නිකාය)
කාලාම සූත්‍රය (අංගුත්තර නිකාය)
මහා පරිනිබ්බාණ සූත්‍රය (දීඝ නිකාය)
කසී භාරද්වාජ සූත්‍රය (සුත්ත නිපාතය)
මෙත්ත සූත්‍රය (සුත්ත නිපාතය)
97,212,216 ගාථා - ධම්මපදය (ඛුද්දක නිකාය)
මුල් බුදු සමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි
බෞද්ධ ආර්ථික දර්ශනය - බෙලිගල්ලේ ධම්මජෝති හිමි
බෞද්ධ චින්තනයෙන් බිඳක් - ගන්තුනේ අස්සජි හිමි
උසස් පෙළ බුද්ධ ධර්මය-කොස්වත්තේ අරියවිමල හිමි

**නිපුණතාව 5.0** : පරිසරය, ආර්ථිකය හා සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ජීවිතයට එක්කර ගනියි.

**නිපුණතා මට්ටම 5.1** : සත්වයා කෙරෙහි බලපාන්නාවූ භෞතික පරිසරය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30

**ඉගෙනුම් ඵල** : පරිසරය කෙරෙහි බැතිමත්ව එය ආරක්ෂා කරයි.
විවේකය ධාර්මිකව ගත කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

## 5.1.1 : සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම

- භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායක ලෙස යොදා ගැනීම පිණිස කළමනාකරණය අත්‍යවශ්‍ය සාධකයක් වන බව.
- පරිසරය, කාලය, මූල්‍ය සම්පත් ආදී විවිධ අංශවල නිසි කළමනාකරණය බුදු සමය අවධාරණය කරන බව

## 5.1.2 බුදු දහම සෞන්දර්ය හා රසාස්වාදය අගය කරන අයුරු

- සෞන්දර්ය රසාස්වාදය බුදු දහම තුළ අවතක්සේරු කර නැති බව.
- බුදුරදුන් විසින් පවා උසස් රසවින්දනය අගය කර ඇති බව.
- බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් භාවනාව මගින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව තුළින් ප්‍රබුද්ධව ප්‍රීතියෙන් කල් ගෙවූ බව.
- විවේකය ධාර්මිකව ගත කිරීමේදී උසස් කාව්‍ය, චිත්‍ර, මූර්ති වැනි කලා මාධ්‍ය මගින් සිය අත්දැකීම් සන්නිවේදනය කළ බව.
- ස්වභාව සෞන්දර්යය හා නිර්මාණ සෞන්දර්යය ඇගයීමට ලක්කොට ඇති අවස්ථා මූලික සූත්‍රවල පවා බහුලව දැකිය හැකි බව.

## 5.1.3 විවේකය හා ධාර්මික ප්‍රීති සුඛය අගය කිරීම

- විවේකය හා ප්‍රීති සුඛය බුදු දහම තුළ අවතක්සේරුකර නැති බව.
- විවේකයත් ප්‍රීති සුඛයත් දැහැමිව ලබා ගැන්මට බුදු දහම මග පෙන්වන බව.
- බෞද්ධ කලාව ඒ සඳහා උපයෝගී කරගත හැකි බව.
- දැහැමි විවේකය හා පරිසර හිතකාමී බව මිනිසාගේ දියුණුවට අත්‍යවශ්‍ය කරුණක් බව.

## 5.1.4 සත්වයාගේ පැවැත්ම සඳහා භෞතික පරිසරය බලපාන ආකාරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

- ශාක හා සත්ව ප්‍රජාවද ජලය වාතය ආදී ස්වභාවික වස්තූන් ද පරිසරයෙහි අංග වන බව
- පුලුල් වූද ගැඹුරුවූද අර්ථකථන සහිත චින්තනයකින් පොහොසත් බුදුසමය ස්වභාවික සම්පත් විෂයයෙහි සුහද මිත්‍රශීලී අවධානයක් යොමුකොට ඇති බව.
- සත්ව ප්‍රජාව ආරක්ෂා කිරීමටත්, තුරුලතා රෝපණය හා රක්ෂණයටත්, ජල දූෂණය, ශබ්ද දූෂණය, වායු දූෂණය ආදී පරිසරයට අහිතකර දෑ වැළැක්වීමටත් බෞද්ධ ඉගැන්වීම් තුළින් විශේෂ අවධානයක් යොමුකර ඇති බව.
- බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවක භික්ෂූන් ද පිරිතුරු සුන්දර පරිසරයට ඇලුම් කළ බව හා සමීප වූ බව.
- පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයෙහි ඇතුළත් බව.
- පිරිසිදුම, පමණ දැන ආහාර ගැනීම, අල්පේච්ඡතාව, අල්පකෘත්‍යතාව,සැහැල්ලු පැවැත්ම, යනාදී සාධක මෙන්ම පාරිසරික සාධකයන්ද ශාරීරික හා මානසික සෞඛ්‍ය සම්පන්න-තාවය පිණිස හේතුවන බව භෞතික සමෘද්ධියම ඉලක්ක කොට ක්‍රියා කරන බව.
- වර්තමාන මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් පරිසරයට අහිතකර ලෙස බලපා ඇති බව සහ එය මිනිසා සහිත සත්ව හා ශාක ප්‍රජාවේ සෞඛ්‍යයට තර්ජනයක් වී ඇති බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1. සම්පත් යනු මොනවාදැයි සිසුන් විමසා ඔවුන් සමාජ සම්පත් සුරැකීම පිළිබඳව දක්වන ආකල්ප විමසන්න.
භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායකව යොදාගැනීම කළමනාකරණයට අයත් එකක් බව සිසුන්ට පවසන්න.

පියවර 2. සෞන්දර්ය, රසාස්වාදය, විවේකය, ධාර්මික ප්‍රීති සුඛය බුදු දහමින් අගය කරන අයුරු කරුණු ගවේෂණයට සිසුන් යොමු කරන්න.

පියවර 3. සිසුන් කරුණු රැස් කිරීමෙන් පසු කණ්ඩායම් දෙකකට බෙදන්න.

**පැවරුම** : "සම්පත් කළමනාකරණය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් පුද්ගල දියුණුවට බාධාවක් නොවේ" යන මාතෘකාව යටතේ සාකච්ඡා මණ්ඩපයක් පවත්වන්න.

**මූලාශ්‍රය** : ඒතදග්ගපාලි - අංගුත්තර නිකාය
මහාවග්ගපාලි
සක්ක පඤ්හ සූත්‍රය (දීඝ නිකාය)
වංගීස සංයුත්ත (සංයුත්ත නිකාය)
ථෙර ථෙරී ගාථා සප්පක ථෙරගාථා - ඛුද්දක නිකාය

84 ගාථාව (ජාතක පාලි)
සේඛියා ධම්ම - පාචිත්තිය පාලි
204 ගාථාව - ධම්මපදය
වනරෝප සූත්‍රය - (සංයුත්ත නිකාය)
මෙත්ත සූත්‍රය (සූත්ත නිපාත)
චක්කවත්ති සීහනාද සූත්‍රය (දීඝ නිකාය)
සිගාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
කළමනාකරණ සංකල්ප - බෞද්ධ ප්‍රවේශයක් - ඉන්ද්‍රානි පෙරේරා
නිවන් මග, බෞද්ධ කළමනාකරණය - 2002 රජයේ මුද්‍රණාලීය බෞද්ධ සංගමය

මුල් බුදු සමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි
මුල් බුදු සමය හා විවරණ ගැටලු - පාතේගම ඥාණාරාම හිමි

බුදුදහම හා පරිසරය - දේවාලේගම මේධානන්ද හිමි

**නිපුණතා මට්ටම 5.2** : සැපය, ධනෝපායනය හා පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18

**ඉගෙනුම් ඵල** : දැහැමිව සැපවත් ජීවිතයක් ගත කරයි.
ධනය ඉපයීම් ධාර්මිකව සිදු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:**

## 5.2.1 සැපය පිළිබඳ බෞද්ධ සංකල්පය හා ජීවිත ගැටලු විසඳීමෙහිලා එහි ඇති උපයෝගීතාව

- මිනිසා සුඛකාමී සත්වයකු ලෙස බුදු සමය පිළිගන්නා බව
- සසර දුක් සහිතයැයි බුදු සමය අවධාරණය කරන නමුදු එහි සැපයක් නැතැයි ඉන් අදහස් නොවන බව සහ සදාචාරාත්මක සීමාවන් තුළ ගිහි බෞද්ධයා ලෞකික වූ පස්කම් සුව විදීම බෞද්ධ ඉගැන්වීම්වලට විරුද්ධ නොවන බව.
- ගිහි සුඛ, පබ්බජ්ජා සුඛ යනාදි වශයෙන් බෞද්ධ ඉගැන්වීම් තුළ සැපය පිළිබඳ විවිධාකාර වර්ගීකරණයන් දැකිය හැකි බව සහ අත්ථි, භෝග, අනණ, අනවජ්ජ සුඛ ගිහි සැපය සම්බන්ධයෙන් වැදගත්වන බව.
- ලෞකික සැපය පිළිබඳ නිරවද්‍යතාව හා ධාර්මිකත්වය උතුම් වන බව, අනුන්ගේ සැපතේදී සතුටු විය යුතු (මුදිතා) බව, ලෞකික වුත්, වේදයිත වූත් සැපයක් නිෂ්ඨාව නොවන හෙයින් ලෝකෝත්තර අවේදයික නිර්වාණයම පරම සුඛය වන බව හා මෙකී කරුණු පිළිබඳ නිරවුල් අවබෝධය ගැටලු විසඳීමෙහිලා උපයෝගීවන බව.
- දිළිඳුකම කාමභෝගී ගිහියන්ට දුකක් බව සහ ධාර්මිකව උපයාගත් ධන සම්පත් පුද්ගලයකු සතුවීම මගින් ලබන ආර්ථික සුරක්ෂිතතාව ලෞකික ජීවිතයට අදාළ සැපයක් ලෙස බුදුසමය පිළිගන්නා බව.
- බුදුසමයෙන් අනුමත කර ඇති දැහැමි ප්‍රතිපදාවට අනුගතව මිස නොකටයුතු වෙළඳාම්,කංසකූට, තුලාකූට, මානකූට, ආදී විවිධ වංචනික කටයුතුවලින් මුදල් සෙවීම නොකළ යුතු බව.

## 5.2.2 ශ්‍රමය, ධනය හා සමාජ ශුභ සිද්ධිය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

- ධනය පිණිස ශ්‍රමය වැය කිරීම අනිවාර්ය බැවින්, අනලස්ව උත්සාහයෙන් හා වීර්යයෙන් ක්‍රියා කළ යුතු බව.
- තම ශ්‍රමය ධාර්මික ජීවිකා වෘත්තීන්හි යෙදවිය යුතු බව සහ ධනය පිණිස කිසිදු ආකාරයක අධාර්මික ක්‍රියාවක උත්සාහවත් නොවිය යුතු බව.
- දැහැමිව ඉපයූ ධනය සුරක්ෂිත කර ගැනීම පිණිස පවිටු මිතුරන්ගෙන් දුරුව, කල්‍යාණ මිත්‍ර සේවනය ඇතිව උපාය ශීලීව

ධන පරිහානි මුඛ වසාදැමිය යුතු බව.

- ධනය පසුපස හඹා ගෙනයාමත්, ධන සම්පත් ජීවිතයේ නිෂ්ඨාව ලෙස නොසැලකීමත්, සම්පත් ගොඩ ගසා නොගෙන සංසරණයට හා පරිහරණයට ඉඩ හැරීමත් කළ යුතු බව.
- යුතුකම් හා වගකීම් වෙනුවෙන් තම දැහැමි ධනය කැප කළ යුතු බව.
- ලෞකික සම්පත්වල යථාර්ථය දැක අතෘප්තිකරභාවයෙන් හා තණ්හාදාසභාවයෙන් මිදී සම්පත් පරිහරණය කිරීම සමාජ ශුභ සිද්ධියට හේතුවන බව.
- සප්ත ආර්ය ධනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අධ්‍යාත්මික හා සමාජයීය යහපතට සෘජුව බලපාන බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1. මෙම නිපුණතා මට්ටමට අදාළව සපයා ඇති මූලාශ්‍ර ලේඛනය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. ඒවා පිළිබඳ සටහන් කරගන්නට ඔවුන්ට උපදෙස් දෙන්න.

පියවර 2. එකී මූලාශයයන්හි ධනය ඉපයීම, පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඇතුළත්වන බැවින් එම ඉගැන්වීම් සොයා ලේඛනගත කරන්නට සිසුන් ගවේෂණයේ යොදවන්න.

පියවර 3. සිසුන් එක්රැස් කරගත් කරුණු ගොනු කරන්නට උපදෙස් දෙන්න. ඒ කරුණු ලෞකික, ලෝකෝත්තර වශයෙන් වර්ග කරන්නට සිසුන් මෙහෙයවන්න.

**පැවරුම** : ලෝකෝත්තර සැපය උසස් වන අතර ලෞකික සැප සාදා ගැනීමට බාධා නොවිය යුතුය යන අදහස යටතේ කෙටි ලිපියක් සකස් කරන්න.

**මූලාශ්‍රය** :

අනණ සූත්‍රය (අංගුත්තර නිකාය)
ව්‍යග්ගපජ්ජ සූත්‍රය (අංගුත්තර නිකාය)
සුඛ වග්ගය - ධම්මපදය (ඛුද්දක නිකාය)
විත්ථතධන සූත්‍රය සත්තක නිපාත (අංගුත්තර නිකාය)
පත්තකම්ම සූත්‍රය (අංගුත්තර නිකාය)
චක්කවත්ති සීහනාද සූත්‍රය (දීඝ නිකාය)
කූටදන්ත සූත්‍රය (දීඝ නිකාය)
පඨම හා දුතිය අකත්තක සූත්‍රය (සංයුක්ත නිකාය)
සිගාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය -පළමු වන කොටස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 12.2 පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සම්පව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back ) හා ඉදිරි පෝෂණය ( Feed Forward ) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත තහැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය :

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| 7. ක්ෂේත්‍ර චාරිකා | 8. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ජා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට , විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

**වාරය** : 1

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 1.0

**නිපුණතා මට්ටම** : 1.2

**උපකරණයේ ස්වභාවය** : විවාදයක්

**ක්‍රියාවලිය** : " සමාජ අයිතිවාසිකම් කාන්තාවට අහිමි නොවිය යුතු ය."

යන මාතෘකාව යටතේ විවාදයක් සංවිධානය කිරීම

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ප්‍රවේශය, මාතෘකාව පැහැදිලි ව හැඳින්වීම හා එහි උචිත බව | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. උචිත ලෙස අංග චලනය හා කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 1

**උපකරණ අංක** : 2

**නිපුණතාව** : 1.0

**නිපුණතා මට්ටම** : 1.4

**උපකරණයේ ස්වභාවය** : දැනුම මිනුම තරඟයක්

**ක්‍රියාවලිය** : " බුද්ධ කාලීන භාරතීය වාණිජ්‍යකරණය හා නාගරිකරණය " පිළිබඳ කෙටි ප්‍රශ්න 20 බැගින් සකස් කොට දැනුම මිනුම තරඟයක්

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. විෂයට අදාළ වන පරිදි ප්‍රශ්න සකස් කර ගැනීම. | 4 | 3 | 2 | 1 |
| 2. උචිත පරිදි කණ්ඩායම් සංවිධානය කර ගැනීම. | 4 | 3 | 2 | 1 |
| 3. ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ කුසලතාව | 4 | 3 | 2 | 1 |
| 4. පිළිතුරු ඉදිරිපත් කිරීමට දක්වන දායකත්වය | 4 | 3 | 2 | 1 |
| 5. ලකුණු වාර්තා කිරීම හා සමස්ත දායකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ——— 20 |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ මුළු ලකුණු}}{2}$ | | | | -------- 10 |

**වාරය** : 1

**උපකරණ අංක** : 3

**නිපුණතාව** : 2.0

**නිපුණතා මට්ටම** : 2.1

**උපකරණයේ ස්වභාවය** : රචනා

**ක්‍රියාවලිය** : " පොදු දේපළ ක්‍රමය පෞද්ගලික දේපළ ක්‍රමයකට පරිවර්තනය වීම තුළින් උපන් සමාජ ගැටලු " මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. තෝරාගත් තොරතුරු වල තේමාවට ඇති අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 2. තේමාව ප්‍රමාණවත් පරිදි තොරතුරු මගින් නිරූපණය වීම | 4 | 3 | 2 | 1 |
| 3. ඉදිරිපත් කර ඇති ප්‍රතිචාර වල අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 4. ප්‍රතිචාර වල තර්කානුකූල බව හා අර්ථාන්විත බව | 4 | 3 | 2 | 1 |
| 5. තෝරාගත් තොරතුරු හා ඉදිරිපත් කර ඇති ප්‍රතිචාර වලින් සමස්තය ආවරණය වී ඇති ප්‍රමාණය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 2

**උපකරණ අංක** : 4

**නිපුණතාව** : 2.0

**නිපුණතා මට්ටම** : 2.2

**උපකරණයේ ස්වභාවය** : ප්‍රදර්ශන පුවරුවක්

**ක්‍රියාවලිය** : පුද්ගල ස්වාධීනත්වය ප්‍රකාශවන බුද්ධ දේශනා උධෘත 10ක් සොයා සිංහල තේරුම් ද ඇතුළත් කොට ප්‍රදර්ශන පුවරුවක් සකස් කිරීම

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව / එහි උචිත බව | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායෙහි යෝග්‍ය බව | 4 | 3 | 2 | 1 |
| 4. අන්තර්ගතයේ ඇති නිර්මාණශීලී බව හා තර්කානුකූල බව | 4 | 3 | 2 | 1 |
| 5. ප්‍රදර්ශන පුවරුවක් වශයෙන් නිමැවුමෙහි සාර්ථක බව | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ____ 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 2

**උපකරණ අංක** : 5

**නිපුණතාව** : 3.0

**නිපුණතා මට්ටම** : 3.1

**උපකරණයේ ස්වභාවය** : බුද්ධි මණ්ඩල සාකච්ඡාවක්

**ක්‍රියාවලිය** : බෞද්ධ රාජ්‍ය පාලන ක්‍රමයෙහි ප්‍රකටවන ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ මැයෙන් බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් පවත්වන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 2. සාකච්ඡා මණ්ඩල සංවිධානය කර ගැනීම මෙහෙයවීම හා තේමා වෙන්කර ගැනීම සහ උපදෙස් අනුගමනය කිරීම. | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යන අයුරින් සංවර්ධනාත්මකව අදහස් ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණශීලී බව හා තර්කානුකූල බව. | 4 | 3 | 2 | 1 |
| 5. සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ——<br>20 |
| අවසාන ලකුණු   ලැබූ මුළු ලකුණු<br>------------------<br>2 | | | | --------<br>10 |

**වාරය** : 2

**උපකරණ අංක** : 6

**නිපුණතාව** : 3.0

**නිපුණතා මට්ටම** : 3.2

**උපකරණයේ ස්වභාවය** : දානමය පිංකමක්

**ක්‍රියාවලිය** : පෝ දිනක අටසිල් සමාදන්ව සිටින උපාසක උපාසිකාවන් සඳහා දාන පිංකමක් සිදු කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1.ආගමික පසුබිම හා එයට ගැලපෙන පරිදි සැලසුම සැකසීම. | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. කටයුතු සංවිධානයේ කැපවීම | 4 | 3 | 2 | 1 |
| 4. අන්තර් පුද්ගල සම්බන්ධතා | 4 | 3 | 2 | 1 |
| 5. සැලසුමේ සාර්ථකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 7

**නිපුණතාව** : 4.0

**නිපුණතා මට්ටම** : 4.1

**උපකරණයේ ස්වභාවය** : භූමිකා රංගන

**ක්‍රියාවලිය** : පුද්ගලයකුගේ දියුණුව හා පිරිහීම පිණිස කුසල අකුසල දෙක බලපාන ආකාරය පෙන්වා දෙන කථා වස්තුවක් නාට්‍යානුසාරයෙන් දැක්වීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1.නිර්මාණශීලී ක්‍රියාකාරකම්වලදී ගොඩනගා ගන්නා නිර්ණායකවලට අනුරූපව මෙහි දී ද නිර්ණායක 5ක් ගොඩනගා ගන්න. | 4 | 3 | 2 | 1 |
| 2. නිර්මාණය සඳහා භාවිත මාධ්‍යයේ උචිත බව | 4 | 3 | 2 | 1 |
| 3. සංවිධානය, ඉදිරිපත් කිරීම නිර්මාණශීලී බව | 4 | 3 | 2 | 1 |
| 4. අරමුණ ඉටුවන ආකාරයෙන් ගොඩනැගී තිබීම | 4 | 3 | 2 | 1 |
| 5. අලංකරණය සඳහා යොදාඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ____<br>20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු<br>------------------<br>2 | | | | --------<br>10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 8

**නිපුණතාව** : 4.0

**නිපුණතා මට්ටම** : 4.2

**උපකරණයේ ස්වභාවය** : උපදේශන සේවා කඳවුරක්

**ක්‍රියාවලිය** : පන්තිභාර ගුරුතුමාගේ ද මඟ පෙන්වීම අනුව පාසල තුළ උපදේශන සේවා කඳවුරක් සංවිධානය

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1.තොරතුරු රැස් කිරීම | 4 | 3 | 2 | 1 |
| 2. තොරතුරු විධිමත්ව වර්ගකර ලේඛනගත කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. අවශ්‍ය සම්පත් දායකත්වය සම්බන්ධ කර ගැනීම | 4 | 3 | 2 | 1 |
| 4. අරමුණු ඉටුවන ආකාරයට කටයුතු සංවිධානය | 4 | 3 | 2 | 1 |
| 5. කාර්යයෙහි සාර්ථකත්වය ඇගයීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ―― 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 3

**නිපුණතාව** : 5.0

**නිපුණතා මට්ටම** : 5.1

**උපකරණයේ ස්වභාවය** : සැලසුමක් සැකසීම

**ක්‍රියාවලිය** : ඔබේ ගෙවත්ත ප්‍රිය මනාප ලෙස සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1.විෂය ක්ෂේත්‍රයට/ඉගෙනුම් අරමුණුවලට ඇති සම්බන්ධතාව අදාළ බව හා නවතාවකින් යුතු වීම | 4 | 3 | 2 | 1 |
| 2. නිර්මාණය සඳහා යොදා ගන්නා විවිධ ද්‍රව්‍යවල හා මාධ්‍යයේ උචිත බව | 4 | 3 | 2 | 1 |
| 3. සංවිධානය, ඉදිරිපත් කිරීම නිර්මාණශීලී බව | 4 | 3 | 2 | 1 |
| 4.අරමුණු ඉටුවන ආකාරයට ගොඩ නැගී තිබීම | 4 | 3 | 2 | 1 |
| 5. අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | ____ 20 |
| අවසාන ලකුණු — ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |